## ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය - 2018

---

**මතය ව්‍යාවනය**

ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.1 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සම්මේලනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන

### 1.4.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.727,303 ක් වූ ක්‍රීඩා උපකරණ සියයට 25 කින් ක්ෂය කරන බව ගිණුම් සටහන්වල දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේදී ක්‍රීඩා උපකරණ ක්ෂය කර නොතිබුණි. එම ක්‍රීඩා උපකරණ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | ජංගම නොවන වත්කම් සහ ඊට අදාළ ක්ෂය වීම් නිවැරදිව ගිණුම්වල දැක්විය යුතුය. |

### 1.4.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| ගෙවීම් විෂයයන් 08 | 4,134,814 | වියදම් විස්තර, අනුමත ඇස්තමේන්තු, බිල්පත් සහ ලදුපත් | ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | ගෙවීම් සම්බන්ධිත ලියවිලි ප්‍රමාණවත් පරිදි විගණනයට ඉදිරිපත් කිරීම. |

## 1.5 ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපචිත වියදම්වල ඇතුලත් වර්ෂ 05 ක් පැරණි එකතුව රු.2,987,449 ක් වූ ගිණුම් ශේෂ 2 ක් හා වර්ෂ 03 ක් පැරණි රු.5,000 ක් වූ ගිණුම් ශේෂ 01 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී විධායක සභාව වෙත ඉදිරිපත් කර පියවීම සඳහා සටහන් කර ගතිමි. | බාහිර පාර්ශවයන් සඳහා ගෙවිය යුතු මුදල් අප්‍රමාදව නිරවුල් කිරීමට ක්‍රියාකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,332,963 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.590,121 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,742,842 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රු.52,159,264 කින් සෘජු වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ අනාගත දිශාව තීරණය කරනු ලබන උපක්‍රමවලින් සංයුක්ත සැලැස්ම සමන්විත විය යුතු අතර සත්‍ය කාර්ය සාධනය ස්ථාවර ඉලක්ක වෙත දිශා ගත වීම සඳහා යථාර්ථවාදී හා ලබා කර ගත හැකි ඉලක්ක ඇතුළත් කර සංයුක්ත සැලැස්මක් සම්මේලනය විසින් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදි විධායක සභාව සමග සාකච්ජා කර කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | සත්‍ය කාර්ය සාධනය ස්ථාවර ඉලක්ක ලබා කර ගත හැකි පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

### 3.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය හා භෞතික ඉලක්කයන් කාලීනව ඉටුකර ගැනීම තහවුරු වීමට සහ වෙන් කරන ලද අරමුදල් ඵලදායි ලෙස උපයෝජනය කිරීම සඳහා වර්ෂය අවසානයේ වගකීම් දක්වමින් අයවැය පදනම් කරගෙන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදි විධායක සභාව සමග සාකච්ජා කර කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | මූල්‍ය හා භෞතික ඉලක්කයන් කාලීනව ඉටුකර ගැනීම සහ අරමුදල් ඵලදායි ලෙස උපයෝජනය සඳහා අයවැය පදනම් කරගෙන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

**3.3** **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සම්මේලනයේ රු. මිලියන 89.1 ක ආදායමක් හා රු. මිලියන 92.3 ක වියදමක් පැවති අතර 2018 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම්වල එකතුව රු. මිලියන 6.7 ක් විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක විය යුතු වූ නමුත් සම්මේලනය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි විධායක සභාව සමග සාකච්ජා කර කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | සම්මේලනයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් අප්‍රමාදව ක්‍රියාත්මක විය යුතුය. |

**3.4** **අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය ප්‍රකාරව ඵලදායි මූල්‍ය පාලනයක් සඳහා එක් එක් මුල්‍ය වර්ෂය ආරම්භ වීමට ප්‍රථම අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද සම්මේලනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කර ගතිමි. | ඵලදායි මූල්‍ය පාලනයක් සඳහා මූල්‍ය වර්ෂය ආරම්භ වීමට ප්‍රථම අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතුය. |